21

# දේශීය යාතු කර්ම හා බැඳි කාන්තා දේව සංකල්පයඃ රිද්දි බිසව් සහ කිරි අම්මා පිදීමේ චාරිත්‍රය ඇසුරින්

*ඩබ්ලිව්. ඒ. ප්‍රියදර්ශනී වීරසිංහ* [1]
HS/2013/1134

රිද්දි බිසව් සහ කිරි අම්මාවරු එක් පිරිසක් ද? දෙපිරිසක් ද? යන්න විග්‍රහ කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ මූලික අරමුණ වේ. මේ සඳහා මූලික වශයෙන් ම අවධානයට ලක්වනුයේ පහතරට ප්‍රදේශයේ ජනප්‍රිය රිද්දි යුගය හෙවත් රටයකුම යාගයත්, කිරිඅම්මා පිදීමේ චාරිත්‍රයක් ය. ලංකාවේ පහතරට ප්‍රදේශයන්හි ප්‍රචලිත රිද්දි බිසව් පිළිබඳ සංකල්පය බිහිවන්නේ රිද්දි යාගය හෙවත් රටයකුම ශාන්ති කර්මය ඇසුරිනි. ශාන්ති කර්ම පුරාවෘත්ත කතාවේ සඳහන් වනුයේ වඳ බිසව් සත් කට්ටුවක් නොඉඳුල් සළුවක් වියා දීපංකර බුදුන්ට පූජාකළ බලයෙන් ඔවුන්ගේ වඳභාවය නැති වූ ආකාරය යි. මෙම වඳ බිසව් සත් කට්ටුව රිද්දි බිසව් ලෙස හඳුන්වයි. එමෙන් ම, ග්‍රාම්‍ය හා නාගරික ජනයා අතර භූගෝලීය සීමාවකින් තොරව සමස්ත ශ්‍රී ලංකාව පුරාම ව්‍යාප්තව පවතින කිරි අම්මා ඇදහිල්ල මෙරට පැරණිම ඇදහිල්ල මෙන්ම ජනප්‍රිය යාතු කර්මයකි. දරුවන් පිළිසිඳ ගැනීමට මෙන්ම ඔවුන් ආරක්ෂා කර ගැනීම උදෙසා කිරි අම්මාවරුන්ගේ පිහිට පතා කිරි අම්මා දානය පවත්වනු ලබයි. දරුවන්ගේ ආරක්ෂාව පතා මෙන්ම දරුවන් ලබා ගැනීමේ අදහසින් පවත්වන කිරි අම්මා පිදීමත්, දරුවන් අපේක්ෂාවෙන් පවත්වනු ලබන රිද්දි යාගයේ රිද්දි බිසවුන් ඇදහීමත් සම්බන්ධ සම්මිශ්‍රණයක් ඇතිවී තිබේ. මේ අදහස පිළිබඳ ගැඹුරින් සලකා බැලීම වටී. ස්ත්‍රීන්ගේ වඳභාවය දුරුකිරීම හා සම්බන්ධ වන රිද්දි බිසව් සහ දරුවන්ගේ ආරක්ෂාව හා සම්බන්ධ වන කිරි අම්මාවරු යන මේ දෙපිරිස එක් පිරිසක්ම වේ යැයි යන්න මෙම අධ්‍යයනයේදී නිගමනයට එළඹිය හැකි ය. මෙම අධ්‍යයනය සඳහා නියැදි ලෙස උපයෝගී කර ගනුයේ රිද්දි බිසවුන් හා කිරි අම්මාවරු සම්බන්ධ පසුබිමයි. සාහිත්‍යමය සාධක මෙන්ම ලියැවී ඇති මූලාශ්‍රය මෙන්ම ක්ෂේත්‍ර ගවේෂණය මගින් ලබාගන්නා දත්ත ද ඉහත අරමුණ විශ්ලේෂණය කිරීම සඳහා උපයෝගී කර ගැනීමට අපේක්ෂිත ය. ඉන් ලබා ගන්නා තොරතුරු අනුව පර්යේෂණයේදී හඳුනාගන්නා ලද සාධක දත්ත විශ්ලේෂණය කර මොවුන් දෙපිරිසක් ද? යන්න නිගමනය කර ගැනීම මෙහි අරමුණයි.

ප්‍රමුඛ පදඃ රිද්දි බිසව්, රිද්දි යාගය, වඳ බිසව් සත් කට්ටුව, කිරි අම්මා

*1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) ප්‍රථම වසර*